# මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA



සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477421 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk



| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2026.04.30 |


## 2026 මාර්තු මාසයේ දී ඉදිකිරීම් කටයුතුවල වර්ධනයක් වාර්තා කළේය

**ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වන සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය, 2026 මාර්තු මාසයේ දී දර්ශකාංක 57.1ක අගයක් වාර්තා කරමින් පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වුවද ඉදිකිරීම් කටයුතුවල අඛණ්ඩ වර්ධනයක් පිළිබිඹු කළේය.** සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ බොහෝ අය විසින් මැදපෙරදිග පවතින ගැටුම්කාරී තත්ත්වය හමුවේ ඇතිවූ ඉන්ධන සහ අමුද්‍රව්‍ය හිඟය, ඉහළ යන පිරිවැය සහ සැපයුම් සීමාවන් හේතුවෙන් පැනනැගී ඇති අභියෝගාත්මක වාතාවරණය පිළිබඳව වාර්තා කරන ලදී.

> **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)**
>
> **57.1**
>
> 2026 මාර්තු

ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නව ඇණවුම් දර්ශකය මෙම මාසය තුළ ද වර්ධනය වූ අතර, සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ බොහෝ දෙනෙකු විසින් ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රදානය කිරීම තවදුරටත් ඉහළ මට්ටමකින් පවතින බව වාර්තා කරන ලදී. පවතින අවිනිශ්චිත වාතාවරණය හමුවේ වුවද සැළසුම් කරගත් බඳවා ගැනීම් සහ මිලදී ගැනීම් අඛණ්ඩව සිදුකිරීම පිළිබිඹු කරමින් සේවා නියුක්ති සහ තොග මිලදී ගැනීම් දර්ශක මාර්තු මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය. ඉදිරියේ දී තවදුරටත් මිල ඉහළ යනු ඇතැයි පවතින අපේක්ෂා හේතුවෙන්, බොහෝ සමාගම් තොග එක්රැස් කර ගැනීමට ප්‍රයත්න දරන අතර, සැපයුම්කරුවන් සීමා සහිතව අමුද්‍රව්‍ය නිකුත් කිරීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබෙන බව ප්‍රතිචාර දැක්වූ බොහෝ අය සඳහන් කළහ. මේ අතර, ප්‍රධාන වශයෙන් ප්‍රවාහනය ආශ්‍රිත ප්‍රමාදයන් හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මෙම මාසය තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | පෙබ. | මාර්. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)** | **70.3** | **57.1** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| නව ඇණවුම් | 70.3 | 67.2 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 56.8 | 57.1 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 55.4 | 55.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 56.9 | 71.4 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිකිරීම් ව්‍යාපෘති තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂාවෙන් ඉදිරි කාර්තුව සඳහා අපේක්ෂා කඩඉම් මට්ටමට වඩා ඉහළින් පැවතුනද, මැද පෙරදිග පවතින ගැටුම්කාරී වාතාවරණයෙන් ඇතිවන අවිනිශ්චිතතා හේතුවෙන් එහි යම් අඩුවීමක් දක්නට ලැබුණි.

### ගෝලීය ප්‍රවණතා

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| යුරෝපා කලාපය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| ප්‍රංශය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| ජර්මනිය | අඩු වේගයකින් පහත වැටීමක් |
| අයර්ලන්තය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඉතාලිය | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| එක්සත් රාජධානිය | අඩු වේගයකින් පහත වැටීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 අප්‍රේල් 30 වන දිනට*

[1] එස්&පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සහ සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මාසික ප්‍රතිචාර 35ක් පමණ ආවරණය වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිව ඇති ඉහළම ශ්‍රේණිගත දේශීය ඉදිකිරීම් සමාගම් ඉලක්ක කර ගනිමින් පසුගිය මාසයට සාපේක්ෂව අදාළ මාසයේ දී ඉදිකිරීම් කටයුතු වල ප්‍රවණතා ග්‍රහණය කරගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

සේවා නියුක්තිය : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන
තොග මිලදී ගැනුම් : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය
ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය
අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.